# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## අඹන්පොළ දුම්රිය ස්ථානයේ දූපත් වේදිකාවක් සහ මගී ගුවන් පාලමක් ඉදිකිරීම

**කොන්ත්‍රාත් අංකය : SRS/F. 8157**

01. ශ්‍රී ලංකා දුම්රිය සේවය සාමාන්‍යාධිකාරී වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් පහත විස්තර කෙරෙන පරිදි අඹන්පොළ දුම්රිය ස්ථානයේ දූපත් වේදිකාවක් සහ මගී ගුවන් පාලමක් ඉදිකිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ. ඇස්තමේන්තුගත පිරිවැය දළ වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 43 කි. (VAT රහිත)

    මෙම ව්‍යාපෘතියට අඹන්පොළ දුම්රිය ස්ථානයේ අඩි 820 ක් පමණ දිග දූපත් වේදිකාවක් සහ මගී ගුවන් පාලමක් ඉදිකිරීම ඇතුළත් වේ. මෙහි වැඩ විෂය පථය සඳහා භූමියෙහි කැණීම්, කොන්ක්‍රීට් වැඩ, ආකෘති වැඩ, වැර ගැන්වීම්, මේසන් වැඩ, PSC බාල්ක ප්‍රවාහනය, පෙර වාත්තු කොන්ක්‍රීට් ඇතිරීම, අත් වැට වැඩ, කපරාරු වැඩ සහ පින්තාරු වැඩ යන කාර්යයන් අයත් වේ.

    දූපත් වේදිකාවේ බිත්ති ඉදිකිරීමේදී ඇඳි රූප සටහන් වලට අනුව දුම්රිය පීලි (Rail uprights) යොදා ගනිමින් ඉදිකිරීමේ ක්‍රමයට විශේෂ අවධානයක් යොමු කළ යුතුය. මේ සඳහා අවශ්‍ය දුම්රිය පීලි කොටස් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් වැඩ බිමට නොමිලයේ ලබා දෙනු ඇත.

02. ඉදිකිරීම් කාලය දින 180 කි.

03. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයැවේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

    - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා C6 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය ලබා තිබීම.
    - 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතුව තිබිය යුතුය.

05. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතා අතරට පහත කරුණද ඇතුළත් වේ.

    - පසුගිය වසර 5 ක කාලය තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස, මෙම ව්‍යාපෘතියට සමාන ස්වභාවයකින් සහ සංකීර්ණතාවයකින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති අවම වශයෙන් එකක් සමානුපාතික කාල සීමාවක් තුළ සාර්ථකව නිම කර තිබීම.

06. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවත, අංක 01, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) කාර්යාලය, ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) දුරකථන අංක 0112693725 වෙතින් ලබාගත හැකි අතර, 2025.09.26 දින සිට 2025.10.16 දින දක්වා වැඩ කරන දිනයන් හිදී 09.00 පැය සිට 15.00 පැය දක්වා කාලයේදී පහත දක්වා ඇති ලිපිනයේ දී ලංසු ලිපිලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

    **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
    **ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
    **ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
    **ඕල්කට් මාවත,**
    **කොළඹ 10, ශ්‍රී ලංකාව.**
    **දුරකථන අංක : 94 (11) 4600204 හෝ 94 (11) 4600209**
    **ෆැක්ස් අංකය : 94 (11) 2 432044**
    **ඊමේල් : srs.slr@gmail.com / tender2@railway.gov.lk**
    **වෙබ් අඩවිය : www.railway.gov.lk**

07. නැවත නොගෙවන ගාස්තුව රු. 10,000.00 ක් ගෙවීමෙන්, අනතුරුව, කොළඹ 10, ඕල්කට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2025.09.26 දින සිට 2025.10.16 දක්වා (නිවාඩු දින හැර) 09.00 පැය සිට 15.00 පැය දක්වා, අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිළදී ගත හැක. ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

08. ලංසු පිටපත් දෙකකින් 2025.10.17 දින 14.00 පැයට හෝ ඊට පෙර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කට් මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ.

09. 2026.01.15 දින දක්වා ලංසු වලංගු විය යුතුය.

10. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් හාර ලක්ෂ තිස් දහසක (රු. 430,000.00) වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණය 2026.02.12 දින දක්වා වලංගු විය යුතුය.

11. පූර්ව ලංසු රැස්වීමක් 2025.10.07 දින 11.00 පැයට කොළඹ 10, ඕල්කට් මාවත, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයේදී පැවැත්වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**
**යොමු අංකය : SRS/F. 8157.**